# සමාජ පන්තිය පුද්ගල සෞඛ්‍යය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

පඤ්ඤාසේකර හිමි, මහකච්චකොඩියේ
සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය.

**සංක්ෂිප්තය**

සමාජ පන්තියක් යනු සමාන ජීවන තත්ත්වයක් ඇති පුද්ගලයින්ගේ එකතුවක් ලෙසින් සරල ව අර්ථකථනය කළ හැකි ය. පුද්ගලයාගේ බලය හා සමාජ තත්ත්වය ඉස්මතු වන ප්‍රධාන නිර්ණායකයක් ලෙසින් සමාජ පන්තිය හඳුනාගත හැකි ය. පන්තිය තීරණය වීමේ දී අධ්‍යාපනය, රැකියාව, ආදායම හා දේපළ යන කාරණා ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනු ලැබේ. එයින් සමාජය තුළ ඉහළ පන්තිය, මධ්‍යම පන්තිය හා පහළ පන්තිය වශයෙන් කොටස් තුනක් ගොඩනැගී ඇත. ඕනෑ ම සමාජයක සමාජ පන්තිය පහළ යනවාත් සමග ම මානව ජීවිතයේ බොහෝ වරප්‍රසාද අහිමි වී යනු දැකිය හැකි ය. ඒ අතරින් රෝගීන්ගේ ප්‍රමාණය ඉහළ යාම එක් කාරණයකි. එය විවිධ පර්යේෂණවලින් ද හෙළි වී ඇත. එහෙයින් සමාජ පන්තිය හා රෝගීභාවය අතර යම් සම්බන්ධයක් ඇති බව පෙනෙන හෙයින් ඒ පිළිබඳ ව අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ විය. මෙම පර්යේෂණය රජයේ හා පෞද්ගලික රෝහල්වලට පැමිණෙන රෝගීන් හා විවිධ රෝග හේතුවෙන් මියගිය පුද්ගලයින්ගේ පවුල් අරමුණු කරගෙන පැවැත්වූ අතර සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණය හා ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයන් ආශ්‍රයෙන් තොරතුරු ලබාගන්නා ලදී. රෝගීන් කුමන පන්තියේ ද යන්න තීරණය කිරීමේ දී ඔවුන්ගේ පවුල් ආශ්‍රිත සාමාජිකයන් ලබන මාසික ආදායම, අධ්‍යාපනය හා කරනු ලබන රැකියාව යන සාධක පදනම් කරගන්නා ලදී. පර්යේෂණයේ දී හඳුනාගත් කාරණා වූයේ සමාජයේ පහළ පන්තියේ පුද්ගලයන් මධ්‍යම පාන්තිකයන්ට වඩා අඩු වයසින් මියයන බවත් මධ්‍යම පාන්තිකයින් සමාජයේ ඉහළ පාන්තිකයින්ට වඩා අඩු වයසින් මියයන බවත් ය. එමෙන් ම ඉහළ පාන්තිකයින් සුව කරගන්නා රෝගවලින් පහළ පාන්තිකයින් මියයන ස්වභාවයක් ද හඳුනාගත හැකි විය. එමෙන් ම පහළ පාන්තිකයින්ට වැළඳෙන සමහර රෝග ඉහළ පාන්තිකයින්ට නො වැළඳෙන ස්වභාවයක් ද හඳුනාගත හැකි විය. මෙයින් පැහැදිලි වන අනෙක් කාරණය නම් ජීවිතයේ ගුණාත්මක බව තීරණය කිරීමේ දී සමාජ ආර්ථික තත්ත්වයේ වටිනාකම කෙතරම් වැදගත් ද යන්න හඳුනාගත හැකිවීම යි. සමාජ අසමානතාව දරුවෙකු බිහිවීමටත් පෙර ඔහුගේ හෝ ඇයගේ සෞඛ්‍යය තීරණය කරන සාධකයක් බව පර්යේෂණයෙන් හෙළි විය. මේ කාරණය ළදරුවාගේ බර හා ළමා මරණ අනුපාතිකයේ පවතින පන්ති වෙනස තුළින් මැනවින් පැහැදිලි වේ. එයින් පැහැදිලි වන්නේ සමාජ පන්තිය හා සෞඛ්‍ය අතර සම්බන්ධතාවක් පවතින බව යි.

**ප්‍රමුඛ පද:** සමාජ පන්තිය, දරිද්‍රතාව, රෝගීභාවය, මරණය

**විද්‍යුත් ලිපිනය:** mpannasekara@yahoo.com